# FEDERATION OF THEATRE ARTISTS IN SRI LANKA
## ලාංකීය නාට්‍ය කලාකරුවන්ගේ ජාතික සංසදය

අභිනව මහා සභා රැස්වීම
කොළඹ ලුම්බිණි රඟහල - 28/03/2015

හිතාදර නාට්‍ය කලාකරුවනි, සහෘර්දයිනි, නාට්‍ය කලා විද්‍යාර්ථිනි, මිත්‍රවරුනි,

ලාංකීය නාට්‍ය කළා කරුවන්ගේ ජාතික සංසදය නිර්මාණය කරන මේ මොහොතේ අප අද මුහුණ දී තිබෙන අර්බුදයේ ස්වභාවය පුළුල් වශයෙන් තේරුම් ගැනීමට අවශ්‍ය කරුණු දෙකක් ඔබ හමුවේ තබමින් මගේ කෙටි අදහස් දැක්වීම මෙසේ අරඹන්නට මම කැමැත්තෙමි.

ඇන්ටෝනින් අර්ටෝ ඔහු ගේ Theatre and Cruelty රචනාව ආරම්භ කරමින් මෙසේ කියයි:

> “we have lost the idea of theatre. And as much as theatre restrict itself to probing the intimacy of a few puppets, thereby, transforming the audience into Peeping Toms, one understands why the elite have turned away from it or why the masses go to the cinema, music-hall and circus to find violent gratification whose intention does not disappoint them. Our sensibility has reached the point where we surely need theatre that wakes us up heart and nerves.” (Artaud, 1970, p. 64).

> අද අපට නාට්‍ය කලාවේ නියම සාරය කුමක්ද යන්න මුළුමනින්ම මග හැරී ගොස් ඇත. වේදිකාව මස්තකයෙහි රූකඩ කිහිපයක සංවාද වලට පමණක් සීමා වී ඇති අපේ නාට්‍ය කලාව නැරඹීමට පැමිණෙන ප්‍රේක්ෂකයා කවුරුන් ද? සිනමාව, සංගීතය, සහ අනෙකුත් සංදර්ශන විසින් ප්‍රක්ෂකයා ක්ෂනිමය සන්තෘප්තියක් රැගෙන යැයි නම් ඔවුන් මේ සංදර්ශන වටා අත්‍යන්තයෙන් රොද බැඳීම කාට නම් විමතියක් දනවයි ද? මේ ඇතිවී ඇති තත්වය අපට තවත් දරා ගත හැකි නොවේ. අපේ නහර වැල් උලුප්පා අප අවදි කරනු ලබන මාදිලියේ නාට්‍ය කලාවක් අද අපට අවශ්‍යව ඇත (Artaud, 1970, p. 64).

මගේ දෙවැනි උපුටනය ලබා ගන්නේ ප්‍රංශ දාර්ශනික ඇලන් බදියු ගේ Theses on Theatre (නාට්‍ය කලාව අරභයා තීසිස) නම් රචනාවේනි. එය මෙසේ යි:

> “In every epoch, the general difficulty that besets the theatre is its relation to the state. The theatre has always relied on the state. What is the modern form of this dependence? This is a matter that requires a delicate estimation. We must subtract ourselves from a polemical vision that would turn the theatre

> into a salaried profession like all others, a grumbling sector of public opinion, a cultural civil service. But we must also subtract ourselves from a concern with the simple fact of the prince, who installs lobbies of courtesans within the theatre, as servile followers of political fluctuations". The theatre must think up its own idea. Our only guide lies in the conviction that, today more than ever, and to the extent that it thinks, the theatre is not a cultural, but an artistic datum (Badiou 2005, p. 76).
>
> "සෑම යුගයකම නාට්‍ය කලාව මුහුණ දුන් පොදු ගැටලුවක් වුයේ එය රාජ්‍යය සමග ඇති පයුරුපාසානය යි. නාට්‍ය කලාව සෑම කල්හි ම රාජ්‍යය මත යැපුණේ ය. මේ යැපුම් ක්‍රියාවලියේ නුතන ස්වරුපය කෙබඳු ද? මේ කරුණ තරමක් සාවධානව සලකා බැලිය යුතු වේ. අනෙකුත් වෘර්තීන්වල නියැලෙන්නන් මෙන් නාට්‍ය කලාව සහ එහි නියැලෙන්නන් ද වයිට් කොලර් ජොබ් කාරයින් යැයි සිතන දෘෂ්ටියෙන් අප අපව මුදවා ගත යුතු ය; මහජන මතයේ නාමයෙන් උඩුබුරුලන ක්‍රියාවලිය නතර කළ යුතු ය; සංස්කෘතික සිවිල් සේවාවෙන් අප විශ්‍රාම ගත යුතු ය. රාජ කුමාරයා පුරඟනන් තම නෘත්‍යාගාරයේ බලමුලු ගන්වන්නේ යම් සේද, ඕනෑම දේශපාලන උච්චාවචනයකටම ඔරොත්තු දෙමින් එයට අනුගතව සේවාව සපයන සුවච කීකරු වෙසඟනන් රොත්තක් වීමේ අනතුරෙන් අප අපව මුදවා ගත යුතු ය. මේ නිසා නාට්‍ය කලාව ඊට ආවේනික සිතිමක නිමග්න විය යුතු ය. වෙන කවරදාකටත් වඩා මේ නාටකීය සිතුවිල්ල පූරණය කර ගැනීමට අප යොමුකරන්නේ අන් කිසිවක් නොව නාට්‍ය භාවිතාව සංකෘතික විභවයක් නොව කලාත්මක ප්‍රකාශනයක් යන සිතුවිල්ල මත ය" (Badiou 2005, p. 76).

මා මෙකී උදෘතයන් දෙක ගෙන හැර දැක්වුයේ නාට්‍ය කලාවේ නියැලී සිටින්නන් ලෙස අද අප මහුණ දී ඇති නිර්මාණාත්මක සහ දේශපාලන අභියෝගයේ ද්විමානිත පැතිකඩ පිලිබඳ යම් අදහසක් ඇති කර ගැනීමට ය. එක් අතකින් අර්ටෝ පවසන පරිද්දෙන් නාට්‍ය කලාවේ අගතිය සනිටුහන් වි තිබෙන්නේ ඉන් පිටස්තර සාදක නිසා පමණක් නොව සජීවී, සාමුහික කලාවක් ලෙස එහිම පැලපදියම් වි, එම කලාව පරිහරණය කිරීමේ, පරිකල්පනය කිරීමේ සහ භාවිතයේ දී අප විසින් ම පනවා ගත් සීමාවන් සහ අගතිගාමීත්වයන් විසිණි. අනෙක් අතට බදියු තර්ක කරන්නේ, නාට්‍ය කලාවේ පැන නැගී ඇති අර්බූද රැසට පිළිතුරු සෙවීමේදී මහජන අවකාශය තුල නාට්‍ය කරුවාගේ සහ නාට්‍ය කලාවේ ස්ථානගත වීමත් රාජ්‍යයත් සමග එයට ඇති සබඳතාවත් ප්‍රබල සාදකයක් ලෙස මතුව එන බව යි. එහෙත් බදියු තවදුරටත් කියන්නේ නාට්‍ය කලාවේ චිරස්ථිතිය අප ප්‍රාර්ථනා කරන්නේ නම් රාජ්‍යයේ විය ගසෙන් නාට්‍ය කලාව වියුක්ත කර ගත යුතු බව යි. ඒ නයින් නාට්‍ය කලාව එයට ආවේනික වූ නාට්‍යමය සිතුවිල්ලක නිමග්න (Theatre Thinks) කළ යුතු ය.

එනිසා ලාංකීය නාට්‍යකරුවන් ලෙස අප හමුවේ ඇති මේ අභියෝග සහ අභිලාෂන් සුළු කොට තැකිය හැකි නොවේ. එමෙන්ම, ඒ අභිලාෂයන් ශාක්ෂාත් කර ගැනීමට ගමන් කළ යුතු මාර්ග ද එතරම් මටසිලුටු වේ යැයි සිතිය නොහේ. නාට්‍ය කලාවේ අප මුහුණ දී සිටින නිර්මාණාත්මක, දාර්ශනික සහ සෞන්දර්යාත්මක ගැටළු නිරාකරණය කිරීමේ අභියෝගය වේදිකාවට පය තබන අප

සියල්ලන්ගේ ම වගකීමක් වනු ඇත. ඒ සඳහා වන පරිවර්තනයන් සඳහා අප එළඹිය යුතුව ඇත්තේ අප අප ගැනම කර ගන්නා සංගායනාවක් හෝ ශාන්තිකර්මයක් ඇසුරෙණි. අද අප රැස්ව සිටින්නේ මේ සංගායනාවේ මූලික කොන්දේසි පරිපූර්ණ කර ගැනීමේ මූලික වඩා කටයුත්ත සඳහා යි.

අපගේ සීමාවෙන් ඔබ්බෙහි පවතින අප ගේ පාලනයට නතු කර ගත නොහැකි යැයි හඟින රාජ්‍යය සහ එහි දේශපාලන උපකරණ සහ ව්‍යුහයන් මෙකී අවවර්ධනයේ වග උත්තර කරුවන් ලෙස අප තවදුරටත් දකිමින් සිටින්නෙමු. එහෙත් අප අද දින උත්සාහ ගනිමින් සිටින්නේ නාට්‍ය කරුවාත්, ප්‍රේක්ෂකයාත්, රාජ්‍යයත් අතර ඇති පසමිතුරුතාවත් අත්‍යන්ත සම්පර්කයත් අතර ගොඩනැගෙන විවේචනාත්මක හිඩැස සොයා යන්නේ කෙසේ ද කියා සමූහයක් ලෙස විමසීමට ඒකරාශී වීම යි.

පසුගිය සති කිහිපයක් තිස්සේ  අප විසින් සාකච්චා කරමින් ගොඩ නගා ගත් මූලික අරමුණු සහ අපේක්ෂා කිහිපයක් ඔස්සේ මේ කරුණු සාක්ෂාත් කර ගැනීමට අප බලා පොරොත්තු වන බව මෙහිදී ඔබට සිහි පත් කළ යුතු ය. මූලික කරුණු 10 ක් ඔස්සේ ලාංකීය නාට්‍ය කළා කරුවන්ගේ ජාතික සංසදය ඉදිරි කාලයේ දී ක්‍රියාත්මක වීමට සැලසුම් කරගෙන සිටි. මේ කරුණු 10 කැටි කර ගත් විට මූලික කරුණු 3ක් ඔස්සේ නාට්‍ය කලාවේ අප සාකච්චා කළ දේශපාලන අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු. ඒ මූලික කරුණු 3 මෙසේ යි:

1. නාට්‍ය හා රංග කලා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම
2. කලා මණ්ඩලය සහ එහා බැඳි අනුමණ්ඩලවල ක්‍රියා කාරිත්වයත් ව්‍යුහයත් තත්කාලීන සංස්කෘතික අවශ්‍යතා අනුව සංශෝධනය කිරීම.
3. නාට්‍ය හා රංගකලා මධ්‍යස්ථානය සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම.

මා ඉහතින් සඳහන් කළ නිර්මාණාත්මක, අධ්‍යාපනික සහ සෞන්දර්යාත්මක පර්යේෂන වල අවශ්‍යතාව සහ එකී විපරිවර්තනයන් ඇතිකරගැනීම සඳහා නාට්‍ය කලා මධ්‍යස්ථානයක අවශ්‍යතාව මේ වන විට දැඩි ලෙස මතුව ඇති බව අප බොහෝ දෙනා ගේ පිළිගනිම යි.

එමෙන්ම අතිශය ජරාජීර්ණ තත්වයකට ඇදවැටී ඇති කළා මණ්ඩලය සහ අනුමන්ඩලවල ක්‍රියාකාරිත්වය ප්‍රතිසංවිධානය කිරීම සඳහා වන නව එළඹුම් යෝජනා කළ යුතුව ඇති බව ද අප විශ්වාස කරන්නෙමු.

තුන්වනුව නාට්‍ය කලා මධ්‍යස්ථානය හා ඒ ආශ්‍රිතව සිදුවන පර්යේෂණ, අධ්‍යාපන සහ නිර්මාණාත්මක ක්‍රියාකාරිත්වයන් සඳහා ක්‍රමික මූල්‍යමය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ප්‍රබල බලපෑම් කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීමේ අවශ්‍යතාවද ඉස්මතුව ඇති බව සඳහන් කළ යුතු  ය.

දසක 6 කට නො අඩු කාලයක් තිස්සේ ලංකාවේ සංස්කෘතික ක්ෂේත්‍රය තුළ අත් කර ගත නොහැකි වූ මේ සා බැරෑරුම් අවශ්‍යතා සමුදායක් අපට කරලියට අද පමුණුවන්නට සිදු වි තිබෙන්නේ ඒවායේ ධාරිතාවය සහ අභියෝගයේ විශාලත්වය පිළිබඳ තක්සේරුවක් නොමැතිව නොවේ. එහෙත් මෙකී මූලික අභිලාෂයන් අභිමුවට නොපමුණුවා අනෙකුත් චුල අවශ්‍යතා මත තවදුරටත් රස්තියාදු වීමෙන්

නාට්‍ය කලාවේ අද අප මුහුණ පා තිබෙන ගැටළු වලට විසඳුම් සෙවීම නිෂ්ඵල දෙයක් බව අප වටහා ගෙන සිටින්නෙමු.

මෙනිසා අදින් ඇරඹෙන ලාංකීය නාට්‍ය කලාකරුවන්ගේ ජාතික සංසදය මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කැපවීමෙන් කටයුතු කරන සංවිධානයක් ලෙස ගොඩනැගීම අප සියල්ලන්ගේම වගකීම බව තවදුරටත් සඳහන් කරමි.

ආචාර්ය සෞම්‍ය ලියනගේ.
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
28/03/2015